# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 16 දරන
# අධිකරණ සංවිධාන (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

## 1989 අංක 16 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1989 නොවැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 48/85

### 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1989 අංක 16 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතේ ය.

1978 අංක 2 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතෙහි 2 වගන්තියේ (ආ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) දිසා අධිකරණ;

(ඇ) චූලායවන අධිකරණ;

(ඈ) මහෙස්ත්‍රාත් අධිකරණ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය එහි "විසිදෙනෙකුට නොවැඩි වූ ද" යන වචන වෙනුවට "හතලිස් දෙනෙකුට නොවැඩි වූද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) ශ්‍රී ලංකාවේ එක් එක් අධිකරණ දිසාවෙහි "දිසා අධිකරණයක්" සහ සෑම අධිකරණ කොට්ඨාශයකම "චූලායවන අධිකරණයක්" සහ "මහෙස්ත්‍රාත් අධිකරණයක්" තිබිය යුතු ය. තවද,

එක් එක් අධිකරණය පිළිවෙළින්, "දිසා විනිශ්චයකාරවරයා" "චූලායවන අධිකරණයේ විනිශ්චයකාරවරයා" "මහෙස්ත්‍රාත්වරයා" යනුවෙන් හැඳින්වෙන එක් තැනැත්තකු විසින් ද ඔහු ඉදිරියේ ද පැවැත්විය යුතු ය." තවද,

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "දිසා අධිකරණය, පවුල් අධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රාථමික අධිකරණය" යන වචන වෙනුවට "දිසා අධිකරණය, චූලායවන අධිකරණය සහ මහෙස්ත්‍රාත් අධිකරණය" යන වචන ආදේශ කිරීමෙන්.

2—ඩී 004647—9,225 (89/05)

5අ, 5ආ සහ 5ඇ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ, 5ආ සහ 5ඇ වගන්ති වශයෙන් බලසහිත විය යුතු ය :—

" අධිකරණ දිනය.

5අ. (1) නඩු විභාග සහ පරීක්ෂණ පැවැත්වීම පිණිස රැස්වන සෑම මූලික අවස්ථා අධිකරණයකම රැස්වීම්වල කාර්යය සඳහා එක් එක් වැඩ කරන ලිත් දිනය අධිකරණ දින දෙකකට බෙදිය යුතු අතර එක් එක් අධිකරණ දිනය පිළිවෙලින් පෙ. ව. 9.45 සහ ප. ව. 1.15 පසු නොවී ආරම්භ විය යුතු ය.

(2) නඩු විභාග සහ පරීක්ෂණ එවැනි සෑම අධිකරණ දිනයක් සඳහා නියම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා එවැනි සෑම අධිකරණ දිනයක්ම, අවම වශයෙන් පැය දෙකහමාරක විවෘත අධිකරණ රැස්වීමකින් සමන්විත විය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට යම් මූලික අවස්ථා අධිකරණයක යම් විනිශ්චයකාරවරයකුට නොහැකි වන අවස්ථාවක දී, එසේ එම නොහැකියාවේ හේතු ඔහු විසින් වාර්තාගත කළ යුතු අතර, එකී හේතුවල පිටපතක් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය.

අධිකරණයේ කාර්යාධිකාරිවරයා පත් කිරීම.

5ආ. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි එවැනි සෑම අධිකරණයක් සඳහාම, අධිකරණ කාර්යාධිකාරීවරයා වශයෙන් හඳුන්වනු ලබන නිලධරයකු අග්‍ර විනිශ්චයකාරවරයා විමසා පත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණ කාර්යාධිකාරීවරයා වෙනම අසුන්ගත යුතු අතර, (3) වන උපවගන්තියෙන් ඔහු වෙත පවරා ඇති සියලු බලතල හෝ අධිකරණ බලය ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණ කාර්යාධිකාරිවරයා පත් කරනු ලැබ ඇති අධිකරණයේ පවරනු ලබන සිවිල් නඩු කටයුත්තක දී උද්ගත වන විසඳිය යුතු ප්‍රශ්න සකස් කිරීම සහ පිළිගැනීම වාර්තාගත කිරීම ඇතුළු විභාග පූර්ව සහ පශ්චාත් විභාග කාරණා සියල්ල සම්බන්ධයෙන් අධිකරණ කාර්යාධිකාරී වරයා යෙදිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කට යුතු කළ යුතු ය :

එසේ වුවද තමා ඉදිරියේ නඩු විභාගය පවත්වා ගෙන යන අතර දී පවත්නා විසඳිය යුතු ප්‍රශ්න සංශෝධනය කිරීමේ ආකාරයෙන් වුවද උචිත යයි සලකනු ලබන අන්‍යාකාරයකින් වුවද නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින් යම් පිළිගැනීම් වාර්තාගත කිරීම සහ යම් විසඳිය යුතු ප්‍රශ්න සකස් කිරීම නිසි වන්නේ ය.

(4) තමා විසින් අන්‍යාකාරයකින් නිසිලෙස කටයුතු කරනු ලැබිය හැකි යම් කාරණයක් අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව ඒ විනිශ්චයකාරවරයා විසින් තීරණය කරනු ලැබීම සඳහා කෘත්‍යාධිකාරිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) යම් අධිකරණයක පවරනු ලැබූ නඩුවක් පිළිබඳව කටයුතු කරගෙන යාමේ දී උද්ගත වන කාර්ය පටිපාටිමය ස්වභාවයෙන් වූ යම් කාරණයක් (3) වන උපවගන්තියේ සඳහන් අවධියෙන් පසු, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් අධිකරණ කෘත්‍යාධිකාරිවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(6) අධිකරණයේ කාර්ය සටහන් පත්‍රය පවත්වා ගෙන යාමද ඇතුළුව, (3) වන උපවගන්තියෙන් අධිකරණ කෘත්‍යාධිකාරිවරයා වෙත පවරා ඇති බලතලවලට හෝ අධිකරණ බලයට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ අනුයාත සියලු ක්‍රියා කිරීමේ බලය අධිකරණ කෘත්‍යාධිකාරිවරයාට ඇත්තේ ය.

අධිකරණ වාර්තාධිකාරිවරයා පත් කිරීම.

5ඈ. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක නිශ්චිතව සඳහන් කරනු ලබන සෑම අධිකරණයක් සඳහා ම, අධිකරණ වාර්තාධිකාරී යනුවෙන් හඳුන්වනු ලබන නිලධරයකු, අග්‍ර විනිශ්චයකාරවරයා විමසා පත් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණ වාර්තාධිකාරී වෙතම අනුන්ගත යුතු අතර, (3) වන උපවගන්තියෙන් ඔහු වෙත පවරා ඇති සියලු බලතල හෝ අධිකරණ බලය, ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණ වාර්තාධිකාරී පත් කරනු ලැබ ඇති අධිකරණයක පවරනු ලබන අපරාධ නඩු කටයුත්තක දී උද්ගත වන පිළිගැනීම් සහ අපරාධෝච්චාරණ වාර්තාගත කිරීම ඇතුළුව එහෙත් දණ්ඩන නියම කිරීම් හැර විභාග පූර්ව

සහ පශ්චාත් විභාග කාරණා සියල්ල සම්බන්ධයෙන් අධිකරණ වාර්තාධිකාරී නිරත විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

තමා ඉදිරියේ නඩු විභාගය පවත්වාගෙන යන අතර දී, නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින්, උචිත යයි සලකනු ලබන යම් පිළිගැනීම් වාර්තාගත කිරීමට ඒ විනිශ්චයකාරවරයාට ඇති බලතල සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවකින් අගතියක් නොවිය යුතු ය.

(4) 5 ආ වගන්තියේ (4) වන (5) වන සහ (6) වන උප වගන්තිවල විධිවිධාන, (1) වන උප වගන්තිය යටතේ පත් කරනු ලබන අධිකරණ වාර්තාධිකාරිවරයාගේ බලතල හා කර්තව්‍යවලට සහ ඒ හා සම්බන්ධව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි දැක්වෙන “ සෑම දිසා විනිශ්චයකාරවරයා ද, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා ද, මහේස්ත්‍රාත්වරයා සහ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා ද සහ ” යන වචන වෙනුවට “ සෑම දිසා විනිශ්චයකාරවරයා ද, චූලායචන අධිකරණයේ විනිශ්චයකාරවරයා සහ මහේස්ත්‍රාත්වරයා ද ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “එකම දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, මහේස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට පිළිවෙළින් අතිරේක දිසා විනිශ්චයකාරවරයන්, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක මහේස්ත්‍රාත්වරයන් හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් ” යන වචන වෙනුවට “ එකම දිසා අධිකරණයට චූලායචන අධිකරණයට සහ මහේස්ත්‍රාත් අධිකරණයට පිළිවෙළින් අතිරේක දිසා විනිශ්චයකාරවරයන්, චූලායචන අධිකරණ විනිශ්චයකාරවරයන් සහ මහේස්ත්‍රාත්වරයන් ” යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“ (2) එවැනි යම් අධිකරණයකට පත් කරනු ලැබූ සෑම අතිරේක දිසා විනිශ්චයකාරවරයකුම, චූලායචන අධිකරණ විනිශ්චයකාරවරයකුම හෝ මහේස්ත්‍රාත්වරයකුම, වෙත

වෙනම විනිශ්චයාසනාරූඪව, අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා අධිකරණය, චූලායවන අධිකරණය හෝ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල සහ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුතු ය." ; තවද,

(ඇ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 9(ආ) (iii) වන වගන්තිය යටතේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකරණ කොට්ඨාස යකට පත් කරනු ලැබූ සෑම මහෙස්ත්‍රාත්වරයකුටම, වෙනත් සෑම අධිකරණ කොට්ඨාසයකටම පත් කරන ලද මහේස්ත්‍රාත්වරයා සමග සමගාමී අධිකරණ බලය ඇත්තේ ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ජූරි සභාවක් මගින් නඩු විභාග කිරීම.

11. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මහාධිකරණයේ සියලු නඩු විභාග ජූරි සභාවක් නොමැතිව තනිවම විනිශ්චයාසනාරූඪවන මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ පවත්වනු ලැබිය යුතු ය.

(2) චෝදනා වලින් යටත් පිරිසෙයින් එක් චෝදනාවක් මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් වරදක් සඳහා වන්නා වූ ද ජූරි සභාවක් මගින් නඩු විභාග කරනු ලැබීමට චූදිතයා විසින් තෝරාගනු ලබන්නා වූ ද අවස්ථාවක, මහාධිකරණයේ නඩු විභාගය මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියේ ජූරි සභාවක් මගින් පවත්වනු ලැබිය යුතු ය.

(3) ජූරි සභාවක් මගින් නඩු විභාග කරනු ලැබීමට චූදිතයා විසින් තෝරා ගැනීම, නඩු විභාගය ආරම්භ කිරීමට පෙර ඕනෑම අවස්ථාවක කරනු ලැබිය හැකි ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) මහාධිකරණය වෙත පැවරී ඇති අද්මිරාල්ති අධිකරණ බලය, තත්කාලයෙහි බලපවත්වන නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි විය යුතු ය. මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම, බලාත්මකව පැවැති රීති, අලුත් රීති සාදනතුරු බලාත්මකව තිබිය යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, මේ රීති ප්‍රකාර කරන ලද යම් ක්‍රියාවක් වලංගු ලෙස කරන ලද ලෙස සහ කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"දිසා අධිකරණවල අධිකරණ බල සීමාව.

19. සෑම දිසා අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, සියලු සිවිල්, ආදායම් භාර, වෛවාහක. වස්තු භංගත්ව සහ තෙස්තමේන්තු කාරණා යන මේ කාරණා අතුරෙන්, මේ පනත යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන ප්‍රකාර හෝ, මූල් අධිකරණ බලය ප්‍රකාර වෙනත් යම් අධිකරණයකට අනන්‍යව පවරා දෙනු ලැබූ නැතහොත් වෙනත් යම් බලධරයකු වෙත අනන්‍යව පවරා දෙනු ලැබූ කාරණා හැර, එකී අනෙකුත් කාරණා සම්බන්ධයෙන් අසීමිත මූල් අධිකරණ බලය සහ එම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා දඩ, දණ්ඩන සහ රාජසන්තක කිරීම් පැනවීමෙහි ලා අධිකරණ බලය දිසා අධිකරණයට ස්වකීය දිසාව තුළ ඇත්තේ ය. තව ද, සිහිවිකල තැනැත්තන්, බාලවයස්කරුවන් හා රක්ෂිත තැනැත්තන් හා ඔවුන්ගේ මුදල් සම්බන්ධයෙන් ද අර්ථලාභීන්ගේ මුදල් සම්බන්ධයෙන් ද පුද්ගල භාරකරුවන් සහ භාරකරුවන් සම්බන්ධයෙන් ද දිසා අධිකරණය වෙත නීතිය මගින් පවරා ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ද අධිකරණ බලය සමාන ආකාරයෙන් දිසා අධිකරණයට ඇත්තේ ය.".

19අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ඒ ප්‍රඥප්තියේ 19අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :—

"සිවිල් අධිකරණ බලය.

19අ. යම් සිවිල් නඩුවක හෝ නඩුවක් ගෙන එනු ලබන්නේ යම් දිස්ත්‍රික්කයක් තුළ ද විත්තිකාර පාර්ශ්වය ඒ දිස්ත්‍රික්කය තුළ පදිංචිව සිටින්නා වූ ද, එසේ නැතහොත් නඩු නිමිත්ත එම දිස්ත්‍රික්කය තුළ උද්ගත වී ඇත්තා වූ ද, එසේ නැතහොත් නඩුව ගෙන එනු ලබන්නේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් හෝ එම දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත්තා වූ ද, එසේ නැතහොත් බලාත්මක කිරීමට අදහස් කරන ගිවිසුම එම දිස්ත්‍රික්කය තුළ දී එළඹ ඇත්තා වූ ද සියලු උත්තරවාද, සිවිල් නඩු සහ නඩු සංජානනය කිරීමේ ද විභාග කර තීරණය කිරීමේ ද පූර්ණ බලය සෑම දිසා අධිකරණයකට ම තිබිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" අභියාචන.

23. (1) තමා පාර්ශ්වකරුවකු වන කිසියම් සිවිල් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී දිසා අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් සිද්ධිය හෝ නීතිය හෝ පිළිබඳ යම් දෝෂයක් මත, නඩු තීන්දුවට විරුද්ධව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තමා පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පාර්ශ්වකරුවකු වීමට අපේක්ෂා කරන්නා වූ හෝ යම් සිවිල් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක ක්‍රියාවලියේ දී දිසා අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අභියාචනාධිකරණයේ අවසරය කලින් ඉල්ලුම්කර ලබාගෙන, සිද්ධිය හෝ නීතිය හෝ පිළිබඳ යම් දෝෂයක් නිවැරදි කර ගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ (24 වන සහ 29 වන වගන්ති ඇතුළුව) V වන පරිච්ඡේදය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදය ප්‍රතියෝජනය කිරීම.

## " V වන පරිච්ඡේදය

## ප්‍රාථමික අධිකරණ

ප්‍රාථමික අධිකරණයේ අධිකරණ බලය.

24. (1) සෑම ප්‍රාථමික අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, ඊට අනන්‍ය මුල් අධිකරණ බලය ඇත්තේ ය. තව ද, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන මුදල් ප්‍රමාණය නොඉක්මවන ණයක්, අලාභයක් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ ද විත්තිකාර පාර්ශ්වය හෝ විත්තිකාර පාර්ශ්වයන් ඒ අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ පදිංචිව සිටින්නා වූ හෝ නඩු නිමිත්ත ඒ අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ උද්ගතව ඇත්තා වූද සියලු නඩු හෝ ඉඩම හෝ එහි යම් කොටසක් හෝ එම අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ පිහිටා ඇති අවස්ථාවන, සිවිල් නඩු විධාන සංග්‍රහයේ LXVI අ පරිච්ඡේදය යටතේ වූ සියලු නඩු කටයුතු ද හිමිකම් පානු ලබන මුදල යට කී නියමයේ නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය නොඉක්මවන්නා වූද

උකස් කරන ලද ඉඩම හෝ එහි යම් කොටසක් ඒ අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ පිහිටා ඇත්තා වූ ද සියලු උකස් නඩු සහ, යම් ඉඩමක අයිතිය, සම්බන්ධතාව හෝ සන්තකය ඇටීමේ අයිතිවාසිකම් ආරාවුලට භාජනය වී ඇති සියලු නඩු සහ ඉඩම් බෙදීම හෝ විකිණීම හෝ සඳහා වූ සියලු නඩු සංජානනය කිරීමේ සහ ඒවා විභාග කොට තීරණය කිරීමේ සම්පූර්ණ බලය සෑම චූලාපේක්ෂා අධිකරණයට ම ඇත්තේ ය. එසේ වුවද ආරාවුලට භාජනය වී ඇති හෝ බෙදීමට ඇති හෝ විකිණීමට ඇති ඉඩමෙහි වටිනාකම නැතහොත් ඒ ඉඩමේ ආරාවුලට පාත්‍ර වී ඇති විශේෂ කොට සෙහි හෝ අයිතිවාසිකමෙහි හෝ සම්බන්ධතා වෙහි වටිනාකම යට කී නියමයෙහි නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු අතර, ඒ ඉඩම හෝ එහි යම් කොටසක් ඒ අධිකරණයේ අධිකරණ බල සීමාව තුළ පිහිටා තිබිය යුතු ය. තව ද, වෙනත් යම් නීතියකින් ඒ අධිකරණය වෙත පවරා ඇති වෙනත් යම් අධිකරණ බලයක් ක්‍රියාත්මක කිරීම ද චූලාපේක්ෂා අධිකරණය විසින් කළ යුතු ය:

තව ද එසේ වුව ද, සාපරාධී සංවාසය හෝ කන්‍යා දූෂණය හෝ විවාහ පොරොන්දු කඩකිරීම හෝ වාසයෙන් සහ සංවාසයෙන් වෙන්වීම හෝ විවාහ බන්ධනයෙන් වෙන්වීමේ දික්කසාදය හෝ විවාහය ශූන්‍ය බවට ප්‍රකාශයක් කරවා ගැනීම හෝ සම්බන්ධයෙන් වූ යම් නඩුවක්, ඒ අධිකරණය විසින් කිසිදු අවස්ථාවක දී සංජානනය නොකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය සම්බන්ධයෙන් නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබනතෙක් බලසහිත නොවිය යුතු ය.

නඩු ගාස්තු.

25. එවැනි සෑම අධිකරණයකම විනිශ්චයකාර වරයකු විසින් යම් නඩුවක දී තම තීන්දුව හෝ ආඥාව ප්‍රකාශ කිරීමේ දී, යුක්ති සහගත යයි සහ සාධාරණ යයි තමාට පෙනී යන ගාස්තු සහ වියදම් ගෙවීම සම්බන්ධයෙන් ආඥාවක් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

අභියාචනා.

26. යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී චූලාපේක්ෂා අධිකරණයක් විසින් දෙන ලද නඩු තීන්දුවකින් හෝ ආඥාවකින් හෝ ඒ

අධිකරණයේ අවසාන නඩු තීන්දුවක බලය ඇත්තා වූ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින්, (අභියාචනය කිරීමේ අයිතිවාසිකම ප්‍රකාශිතවම අහිමි කර ඇති අවස්ථාවක හැර) එවැනි යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව, ඒ මූලායතන අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත, ඒ මූලායතන අධිකරණයේ අවසරය හෝ එසේ අවසර දීම ඒ අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම මහාධිකරණයේ අවසරය පිට, අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ ය. එවැනි නඩු තීන්දු හෝ ආඥා සම්බන්ධයෙන් ස්වකීය අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, මහාධිකරණය විසින් එවැනි යම් ආඥාවක් හෝ නඩු තීන්දුවක් නීතිය අනුව ස්ථිර කිරීම, ප්‍රතිවර්තන කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම නැතහොත් ඒ අභියාචනය කර ඇත්තේ යම් මූලායතන අධිකරණයක නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධ ව ද ඒ මූලායතන අධිකරණයට විධාන දීම හෝ සුදුසු යැයි මහාධිකරණය විසින් සලකනු ලැබිය හැකි නියමයක් මත අලුතින් නඩු විභාගයක් පවත්වන ලෙස හෝ වැඩිදුර විභාගයක් පවත්වන ලෙස හෝ ආඥා කිරීම හෝ කළ හැකි ය.

විත්තිවාචකය හෝ හරස් ඉල්ලීම අධිකරණයේ අධිකරණ බලය ඉක්මවන අවස්ථාවල කාර්ය පටිපාටිය.

27. යම් මූලායතන අධිකරණයක් ඉදිරියේ වූ යම් නඩු කටයුත්තක දී විත්තිකරුගේ විත්තිවාචකය හෝ හරස් ඉල්ලීම ඒ අධිකරණයේ අධිකරණ බලය ඉක්මවන යම් කාරණයකට අදාළ වන අවස්ථාවක, පැමිණිලිකරුගේ ඉල්ලීමට හා විත්තිකරුගේ විත්තිවාචකයට සහ හරස් ඉල්ලීමට අදාළවන තාක් දුරට ආරාවුලට තුඩුදුන් කාරණය සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම සඳහා ඒ අධිකරණයේ නිසි බලය හා කාර්ය භාරය කෙරෙහි ඒ විත්තිවාචකය හෝ හරස් ඉල්ලීමට බල නොපෑ යුතු ය.

එසේ වුව ද, එවැනි යම් නඩු කටයුත්තක යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම මත, සුදුසු යයි අභියාචනාධිකරණය විසින් හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින් හෝ අදහස් කරනු ලැබුවහොත් නඩුව පැවති අධිකරණයේ සිට විවාදයට තුඩු දුන් මුළු කාරණයම විභාග කිරීමට බලය ඇති අධිකරණයක් වෙත ඒ සම්පූර්ණ නඩු කටයුත්තම මාරු කරන ලෙස අභියාචනාධිකරණය විසින් හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින් හෝ ආඥා කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. තවද එවැනි අවස්ථාවක, ඒ නඩු කටයුතුවල වාර්තාව, ඒ ආඥාවෙන්

නඩු කටයුත්ත මාරු කරනු ලැබ ඇති අධිකරණය වෙත පළමු කී අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යවනු ලැබිය යුතු ය. තවද, ඒ නඩු කටයුත්ත ඉන් ඉක්බිතිව ඒ පසුව කී අධිකරණයේ මුලින්ම ආරම්භ කරන ලද නඩු කටයුත්තක් ලෙස නොකඩව පවත්වා ගෙන යාම සහ මෙහෙය වීම ඒ අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

චූලායචන අධිකරණයේ විනිශ්චයකාර වරයා විසින් අභියාචන නඩු තීන්දු යනාදිය ක්‍රියාවේ යෙදවිය යුතු බව.

28. යම් අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ අභියාචනාධිකරණය විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය විසින් දෙනු ලැබූ හා ප්‍රකාශ කරන ලද සියලු නඩු තීන්දුවලට, ආඥාවලට සහ තීන්දු ප්‍රකාශවලට අනුකූලව ක්‍රියා කිරීම සහ චූලායචන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් දෙන ලද මුල් නඩු තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් ඒ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම සෑම චූලායචන අධිකරණයකම විනිශ්චය කාරවරයා විසින් කරනු ලැබිය යුතු ය.

නඩුවේ වටිනාකම අධිකරණයේ අධිකරණ බලය ඉක්මවන අවස්ථාවක.

29. යම් චූලායචන අධිකරණයක ඉදිරිපත් කොට ඇති යම් නඩුවක වටිනාකම ඒ අධිකරණයේ මූල්‍ය අධිකරණ බලය ඉක්මවන බවට සාක්ෂි ඇති අවස්ථාවක විනිශ්චයකාරවරයා විසින් ඒ අනුව ආඥාවක් කළ යුතු අතර, එම සිද්ධිය වාර්තා ගත කළ යුතුය. තවද, එවිට නඩුව උචිත දිසා අධිකරණයට මාරු වන්නේ ය.

අන්‍යෝන්‍ය එකඟත්වයක් බේරුම් කිරීම.

30. උචිත අවස්ථාවල දී, පාර්ශ්වකරුවන්ගේ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් ඔවුන් අතර බේරුම් කිරීමක් ඇති කිරීමට සහ ඔවුන් අතර යම් දුක් ගැනවිල්ලකට සැබෑ හේතුවක් තිබේ නම් එය, ඔවුන්ගේ අන්‍යෝන්‍ය එකඟත්වය ඇතිව ඉවත් කිරීමට සියලු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගවලින් ප්‍රයත්න දැරීම චූලායචන අධිකරණයේ විනිශ්චය කාරවරයාගේ කාර්යය වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන කොටස ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය (32 වන සහ 36 වන වගන්ති ද ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ "දිසා අධිකරණ, පවුල් අධිකරණ හෝ මහේස්ත්‍රාත් අධිකරණ" යන වචන වෙනුවට "දිසා අධිකරණ, චූලායචන අධිකරණ හෝ මහේස්ත්‍රාත් අධිකරණ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි "දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු" යන වචන වෙනුවට "දිසා විනිශ්චයකාරවරයකු, චූලායවන අධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු වගන්තියේ "දිසා අධිකරණයේ, පවුල් අධිකරණයේ, මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ ප්‍රාථමික අධිකරණයේ" යන වචන වෙනුවට "දිසා අධිකරණයේ, චූලායවන අධිකරණයේ සහ මහෙස්ත්‍රාත් අධිකරණයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනත යටතේ පිහිටුවන ලද මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, චූලායවන අධිකරණයට සහ මහෙස්ත්‍රාත් අධිකරණයට රෙජිස්ට්‍රාර්වරයකු, නියෝජ්‍ය පිස්කල්වරයකු සහ, ඒ අධිකරණවල අධිකරණ නියෝග භාර දීම සහ තීන්දු ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීම සහ යම් ලිඛිත නීතියක් යටතේ ක්‍රියාත්මක කළ හැකි වෙනත් ආඥා ක්‍රියාත්මක කිරීම ද ඇතුළුව, ඒ අධිකරණවල පරිපාලනය සඳහා සහ බලතල යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.";

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) අධිකරණයට පත් කරනු ලැබූ සෑම නියෝජ්‍ය පිස්කල්වරයකුම, ඒ අධිකරණය විසින් නිකුත් කරන ලද විධාන භාර දීම සහ ඒ අධිකරණය විසින් කරන ලද තීන්දු ප්‍රකාශ සහ ආඥා ක්‍රියාවේ යෙදවීම සඳහා වගකිව යුතු අතර, පිස්කල්වරයාගේ අධීක්ෂණය, මෙහෙයවීම සහ පාලනය යටතේ ඔහු ක්‍රියා කළ යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මහාධිකරණයක, දිසා අධිකරණයක හෝ පවුල් අධිකරණයක" යන වචන වෙනුවට "මහාධිකරණයක හෝ දිසා අධිකරණයක හෝ චූලායවන අධිකරණයක" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) එවැනි ඉන්ජන්ෂන් තහනමක් නඩුව ආරම්භ වීමෙන් පසු සහ අවසාන නඩු තීන්දුව දීමට පෙර කවර වූ හෝ අවස්ථාවක විත්තිකරු වෙත දැන්වීමක් නිර්මෙන් පසුව නිකුත් කරනු ලැබිය හැකිය. ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කිරීමේ පරමාර්ථය ප්‍රමාදයක් නිසා ඉෂ්ට නොවන අවස්ථාවක, ඉන්ජන්ෂන් තහනම සඳහා වූ ඉල්ලීම විභාග කර තීරණය කරනු ලබන තුරු එහෙත් එක් වරදකට දින දහහතරක් නොඉක්මවන කාල සීමාවක් සඳහා අධිකරණය විසින් විත්තිකරු වාරණය කරනු ලැබිය හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "සෑම දිසා අධිකරණයක්ම, පවුල් අධිකරණයක්ම, මහේස්ත්‍රාත් අධිකරණයක්ම සහ ප්‍රාථමික අධිකරණයක්ම" යන වචන වෙනුවට, "සෑම දිසා අධිකරණයක්ම, චූලායචන අධිකරණයක්ම සහ මහේස්ත්‍රාත් අධිකරණයක්ම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(i) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "දිසා අධිකරණයක් සහ පවුල් අධිකරණයක් විසින්" යන වචන වෙනුවට "දිසා අධිකරණයක් විසින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) චූලායචන අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය විසින්—

රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස දහ අටක් නොඉක්මවන කාලයකට බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීම ;

(iii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය ඉවත් කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය ඒ ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 60අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

"3 වන වගන්තිය යටතේ ආඥාවක ප්‍රතිඵලය.

60 අ. 3 වන වගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවක් හේතු කොට ගෙන, යම් අධිකරණ කලාපයකට, අධිකරණ දිසාවකට හෝ අධිකරණ කොට්ඨාසයකට අයත් යම් ප්‍රදේශයක් වෙනත් හෝ අලුත් අධිකරණ කලාපයකට, අධිකරණ දිසාවකට හෝ අධිකරණ කොට්ඨාසයකට මාරු කරනු ලැබූ අවස්ථාවක දී, මුලින් සඳහන් කළ කලාපය, දිසාව හෝ කොට්ඨාසය සඳහා පිහිටුවන ලද යම් අධිකරණයක් ඉදිරියේ විභාගයට පාත්‍රව තිබුණු යම් නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, යට කී ආඥාව කරන ලද දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයේ දී ඒ අධිකරණය විසින් පවත්වා ගෙන යාම සහ අවසන් කිරීම ද කරනු ලැබිය යුතු බවට සැක දුරුකිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන සහ හතරවන උපලේඛන මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන සහ හතරවන උපලේඛන ඉවත් කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) "නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා, විවිධ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෝ, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහා ලේකම්වරයා" යන වචන වෙනුවට "නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරයා, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරයෝ, විවිධ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෝ, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහා ලේකම්වරයා ; යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයෝ ;" යන වචන වෙනුවට "ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයෝ, ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයෝ ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) "රජයේ නීතිඥවරයෝ සහ විවිධ අමාත්‍යාංශවල සහකාර ලේකම්වරයෝ ;" යන වචන වෙනුවට "රජයේ නීතිඥවරයෝ, සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයෝ සහ විවිධ අමාත්‍යාංශවල සහකාර ලේකම්වරයෝ ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) "පවුල් අධිකරණයේ විනිශ්චයකාරවරයා සහ පවුල් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා" සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම අත්හැරීමෙන් ;

(ඉ) "ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා" යන වචන වෙනුවට "එක් එක් චූලායවන අධිකරණයේ විනිශ්චය කාරවරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) "දිසා අධිකරණවල, පවුල් අධිකරණවල, මහේස්ත්‍රාත් අධිකරණවල සහ ප්‍රාථමික අධිකරණවල රෙජිස්ට්‍රාර්වරයන්" යන වචන වෙනුවට "දිසා අධිකරණවල, මහේස්ත්‍රාත් අධිකරණවල සහ චූලායවන අධිකරණවල රෙජිස්ට්‍රාර්වරයන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(උ) ඒ උපලේඛනයේ අගට මෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"පිළිවෙළින් තම තමන්ගේ පොලිස් ප්‍රදේශ සඳහා (වැඩ බලන පොලිස් ස්ථාන භාර, පොලිස් උප පරීක්ෂක හෝ ඊට උසස් නිලයක් දරන නිලධරයන්.".

අන්තර් කාලීන විධිවිධාන.

25. (1) මේ පනත ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි පවුල් අධිකරණයක විභාගයට භාජනව පැවති සියලු වෛවාහක නඩු, නඩු කටයුතු හෝ කාරණා උචිත දිසා අධිකරණය වෙත භාරවන අතර ඒ වෛවාහක නඩු, නඩු කටයුතු හෝ කාරණා සංජානනය කිරීමට, විභාග කොට තීරණය කිරීමට හෝ නොකඩව පවත්වාගෙන යාමට සහ නිම කිරීමට අධිකරණ බලය ඒ දිසා අධිකරණයට ඇත්තේ ය. තවද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර ඉහත කී පවුල් අධිකරණය විසින් දෙන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ ආඥා, ඒ දිසා අධිකරණය විසින් දෙන ලද හෝ ප්‍රකාශ කරන ලද පරිද්දෙන් බල සහිත සහ වලංගු වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට ඉහතින් ම වූ දිනයෙහි යම් ප්‍රාථමික අධිකරණයක විනිශ්චයට භාජනව පැවති සියලු සිවිල් නඩු, නඩු කටයුතු හෝ කාරණා, උචිත චූලායවන අධිකරණය වෙත භාර වන අතර ඒ සිවිල් නඩු, නඩු කටයුතු හෝ කාරණා සංජානනය කිරීමට, විභාග කොට තීරණය කිරීමට හෝ නොකඩව පවත්වාගෙන යාමට සහ නිම කිරීමට ඒ අධිකරණයට අධිකරණ බලය ඇත්තේ ය. තවද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙර ඉහත කී ප්‍රාථමික අධිකරණය විසින් දෙන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ ආඥා ඒ චූලායවන අධිකරණය විසින් දෙන ලද්දක් හෝ ප්‍රකාශ කරන ලද්දක් පරිද්දෙන් වලංගු සහ බලසහිත වන්නේ ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයේ දී ප්‍රාථමික අධිකරණයක විනිශ්චයට භාජනව පැවතියා වූ සියලුම අපරාධ නඩු, නඩු කටයුතු හෝ කාරණා, උචිත මහේස්ත්‍රාත් අධිකරණය වෙත භාර වන අතර ඒ අපරාධ නඩු, නඩු කටයුතු හෝ කාරණා සංජානනය කිරීමේ, විභාග කොට තීරණය කිරීමේ හෝ නොකඩව පවත්වාගෙන ගොස් නිම කිරීමේ අධිකරණ බලය ඒ මහේස්ත්‍රාත් අධිකරණයට ඇත්තේ ය. තවද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර එවැනි යම් අපරාධ නඩුවක්, නඩු කටයුත්තක්

හෝ කාරණයක් හෝ සම්බන්ධයෙන් එකී ප්‍රාථමික අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද හෝ දෙන ලද නඩු තීන්දු සහ ආඥා, එකී මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ දෙනු ලැබූ පරිද්දෙන් වලංගු සහ බලසහිත වන්නේ ය.

(4) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ විභාගයට භාජන වී පැවති සියලු නඩු කටයුතු, උචිත චූලායචන අධිකරණය වෙත භාරවන අතර, ඒවා සංජානනය කිරීමේ විභාග කොට තීරණය කිරීමේ හෝ පවත්වාගෙන ගොස් නිම කිරීමේ අධිකරණ බලය ඒ අධිකරණයට ඇත්තේ ය. තවද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙර යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ප්‍රාථමික අධිකරණයක් විසින් කරනු ලැබූ සියලු ආඥා එකී චූලායචන අධිකරණය විසින් කරනු ලැබූ පරිද්දෙන් වලංගු සහ බලසහිත වන්නේ ය.

(5) ආරාවුලක් සම්බන්ධයෙන් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ වූ නඩු කටයුත්තක් චූලායචන අධිකරණයක් වෙත පවරනු ලැබූ අවස්ථාවක දී ඒ නඩු කටයුත්ත විභාග කොට තීරණය කිරීමට පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) ඒ ආරාවුල සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ LXVIඅ පරිච්ඡේදය යටතේ ආඥාවක් කිරීමේ දී, එකී නඩු කටයුතු විභාග කරගෙන යාමේ දී ප්‍රාථමික අධිකරණය ඉදිරියේ දෙනු ලැබූ වාචික සාක්ෂිවලට චූලායචන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලක් නොදැක්විය යුතු ය ;

(ආ) ඒ සංග්‍රහයේ 833 ඇ වගන්තියේ (1) වන උපවගන්තිය ඒ නඩු කටයුත්තට අදාළ කිරීමේ කාර්ය සඳහා, එකී ආරාවුල සම්බන්ධයෙන් වූ තොරතුරු ඉදිරිපත් කරනු ලැබූ දිනය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනය ලෙස සැලකිය යුතු ය ; තවද

(ඇ) ඒ සංග්‍රහයේ 833 ඇ (6) (ii) වන වගන්තියේ දක්වෙන "එක් සතියක්" යන සඳහන වෙනුවට "දෙසතියක්" යන සඳහන ආදේශ කරනු ලැබූ පරිද්දෙන් ඒ වගන්තිය නඩු කටයුත්තකට අදාළ විය යුතු ය.".

අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.

26. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.